# විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
# வெளிநாட்டு வளங்கள் திணைக்களம்
# Department of External Resources

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), තැ.පෙ. 277, කොළඹ 00100, ශ්‍රී ලංකාව
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), த. பெ. இல. 277, கொழும்பு 00100, இலங்கை
Ministry of Finance, Planning and Economic Development
The Secretariat (3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

**Website**: www.erd.gov.lk **e-mail:** info@erd.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ER/AB/EN/39 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 01/10/2026 |

**මාධ්‍ය නිවේදනය**

**පියැසිපාදක සූර්ය බලශක්තිය එක් කිරීමේ සහ අථත්‍ය ශුද්ධ මනුකරණය පිළිබඳ ව්‍යාපෘතිය සඳහා යුරෝපා සංගමය හා ජපාන රජයේ ප්‍රදාන සංරචකයක් සහිතව ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) මූල්‍ය ආධාර ලබා ගැනීම**

ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 35 ක සහනදායී ණය මුදලක් සමඟ යුරෝපා සංගමයෙන් (EU) යුරෝ මිලියන 5.4ක (ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 16.94 කට සමාන) ප්‍රදානයක් සහ ඒකාබද්ධ ණය යාන්ත්‍රණය සඳහා වන ජපාන අරමුදලින් (JFJCM) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 5.5ක ප්‍රදානයක් ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා පවත්වන ලදී.

බලශක්ති අමාත්‍යාංශය විසින්, සීමාසහිත ලංකා විදුලි බෙදාහැරීමේ (පුද්ගලික) සමාගම (EDL) සහ ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) යන ආයතන සමඟ එක්ව, 2026 සිට 2030 දක්වා කාලය තුළ දැරිය හැකි පිරිසිදු බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කිරීමට රජය දරනු ලබන උත්සාහයන්ට සහාය වීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ EDL ආයතනයේ CEB Assist පද්ධතිය, උසස් මිනුම්කරණ යටිතල පහසුකම්, විකාශිත බලශක්ති සම්පත් කළමනාකරණ පද්ධතියක් සහ උසස් බෙදාහැරීම් කළමනාකරණ පද්ධතියක් මඟින් සහය දක්වන බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන සමඟ වැඩිදියුණු කෙරේ. මෙම පද්ධති මඟින් EDL ආයතනයේ පාරිභෝගික සහ මෙහෙයුම් සේවා ඩිජිටල්කරණයට ලක් කිරීම මෙන්ම, බිඳවැටීම්වලට පසු විදුලි සැපයුම ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමේ හැකියාව හරහා ජාලයේ විශ්වාසනීයත්වය ද ඉහළ නංවනු ඇත. තවද, ස්මාර්ට් මීටර් සහ ඒවාට අදාළ යටිතල පහසුකම් මඟින් පුනර්ජනනීය බලශක්තියේ භාවිතය පුළුල් කිරීම සඳහා අවශ්‍ය තත්කාලීන දෘශ්‍යතාව සහ පාලන හැකියාව සපයනු ලබන අතර, සූර්ය බලශක්තියේ ප්‍රතිලාභ තවත් පිරිසකට ලබාදීමට ඉඩ සලසනු ඇත. ඒ අනුව EDL ආයතනය වඩාත් කාර්යක්ෂම, විශ්වාසනීය සහ තිරසාර ස්මාර්ට් විදුලි ජාලයක් ස්ථාපිත කරනු ඇත.


| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>**பணிப்பாளர் நாயகம்**<br>Director General | 94-11-2484693 | කාර්යාලය<br>**அலுவலகம்**<br>Office | 94-11-2484500<br>94-11-2484600 | ෆැක්ස් අංකය<br>தொலை நகல்<br>Fax | 94-11-2447633<br>94-11-2387153 |

මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට අථත්‍ය ශුද්ධ මිනුම්කරණ (Virtual Net Metering - VNM) ක්‍රමවේදය හඳුන්වා දෙනු ලැබේ. යුරෝපා සංගමයේ ප්‍රදානයකින් මූල්‍යමය වශයෙන් සහාය ලබන මෙගාවොට් 25ක සමුච්චිත හල මත සූර්ය විදුලි ජනන පද්ධති, රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ විදුලි බිල්පත් බර අවම කිරීම සඳහා යොදා ගනු ඇත. මෙම පද්ධති නවීනතම පාලන තාක්ෂණයෙන් සමන්විත වන අතර, පවතින ජාල සීමාකාරී තත්ත්වයන්ට අනුකූලව ඒවායේ ජනනය ජාතික පද්ධති ක්‍රියාකරුට කළමනාකරණය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

LECO ආයතනයේ සේවා ප්‍රදේශය තුළ VNM යෝජනා ක්‍රමයට අමතරව, බෙදාහැරීම් ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අඩු පාඩු සන්නායක ස්ථාපනය කෙරේ. බෙදාහැරීම් ට්‍රාන්ස්ෆෝමර් මට්ටමේ ස්ථාපනය කෙරෙන ඉහළ ධාරිතාවයකින් යුත් බැටරි බලශක්ති ගබඩා පද්ධති මඟින්, ජාලයට පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධ කිරීමේ ධාරිතාව වැඩිදියුණු කිරීම සහ එම බලශක්තිය කළමනාකරණය කිරීමේ පාලන හැකියාව ශක්තිමත් කරනු ඇත. විශේෂයෙන්ම මීගමුව ප්‍රදේශය කෙරෙහි අවධානය යොමු කරමින්, LECO ආයතනය බලාපොරොත්තු වන්නේ වැඩි ධාරිතාවකින් යුත් වාණිජ හා කාර්මික විදුලි බරවලට ජාල සම්බන්ධතා පහසු කිරීම, පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් අවශෝෂණය කරගැනීම සඳහා ජාලය ශක්තිමත් කිරීම සහ විදුලි සැපයුමේ නම්‍යශීලීතාව, ඔරොත්තු දීමේ හැකියාව සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමයි.

ඒ අනුව, අදාළ ණය සහ ප්‍රදාන ගිවිසුම් 2026 ඔක්තෝබර් 1 දින කොළඹ පිහිටි මහා භාණ්ඩාගාරයේදී අත්සන් තබන ලදී. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා විසින් ද, ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් එහි ශ්‍රී ලංකා නේවාසික අධ්‍යක්ෂ ශැනොන් කව්ලින් මහත්මිය විසින් ද අදාළ ගිවිසුම් සඳහා අත්සන් තබන ලදී. එම අවස්ථාවට ශ්‍රී ලංකාවේ යුරෝපා සංගමයේ දූත මණ්ඩලයේ හවුල්කාරිත්ව අංශ ප්‍රධානී වර්ජිනි ලෆ්ලර්-ටිග් මහත්මිය සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධානී (අමාත්‍ය) නඔකි කමොෂිඩා මහතා ද සහභාගී වූහ.

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**
**2026 ඔක්තෝබර් 1**